**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

ගණිතය - 2 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

නම - පී.වී.චන්ද්‍රිකා සමන්ලතා

ර/වේවැල්වත්ත කනිෂ්ඨ විද්‍යාලය

**03 පාඩම - සම්බන්ධතා හඳුනා ගැනීම**

## පෙර වැඩ කාර්ය පත්‍රිකාව

### ❖ සූදානම් කර ගත යුතු දේවල්

- එකම වර්ගයේ මල් 5 ක් සහ කොළ 5 ක්
- සමාන දිගැති ඉරටු කැබලි 5 ක්
- වැලි පිරවූ ටින් 4 ක්
- ඉරටුවල ගැසූ මල් 4 ක්
- ජම්බු ගෙඩියක හා පේර ගෙඩියක රූපයක්
- A 4 කොළයක් හා පැස්ටල් පාට කූරක්

01. ඔබේ මිදුලේ වවා ඇති මල් පෝච්චිවල සෑම පෝච්චියක ම මල් පිපී ඇත්දැයි බලන්න. මල් පිපී නැති පෝච්චි තිබේදැයි බලන්න.

02. වැලි පිරවූ ටින් එකකට ඉරටුවක ගැසූ මල බැගින්, ටින් 4 ට ම දමන්න.

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

ගණිතය - 2 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

නම - පී.වී.චන්ද්‍රිකා සමන්ලතා

ර/වේවැල්වත්ත කනිෂ්ඨ විද්‍යාලය

## 03 පාඩම - සම්බන්ධතා හඳුනා ගැනීම

### <u>පැවරුම</u>

01. ශාක පත්‍ර 5 හා මල් 5 එකිනෙකට ඈතින් පේළි දෙකක් ලෙස තබන්න. මලට කොළය බැගින් තිබේදැයි බැලීමට මල් හා කොළ ඉරටු කැබලි තබා යා කරන්න.



ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු කියන්න.

- සෑම මලකට ම කොළයක් තිබේ ද?
- සෑම කොළයකට ම මලක් තිබේ ද?
- කොළ ගණනට මල් ගණන සමාන ද?
- කොළවලට වඩා මල් වැඩි ද? අඩු ද?

02. පහත පින්තූර යා කරන්න.





❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

- වැඩියෙන් ඇත්තේ ගිරවි / අඹ .

❖ පහත කවිය ගායනා කරන්න.

රස පලතුරු ගොඩයි
කෑවොත් හරි ගුණයි
පේර ජම්බු තෝර ගන්න
වට්ටි අමමා මමයි

❖ ජම්බු ගෙඩියක හා පේර ගෙඩියක රූපය A4 කොළයේ දකුණු පැත්තෙන් අලවන්න. එයට ඉදිරියෙන් ඔබේ පවුලේ සිටින අයගේ නම් පහළට ලියන්න.





අම්මා
තාත්තා
අක්කා
ආච්චි
මම

ඉන් පසු ගෙදර අයගෙන් වඩාත් කැමති පලතුරු වර්ගය කුමක් දැයි අසා පාට කූරකින් නමෙහි සිට පලතුරට යා කරන්න. ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

- ජම්බුවලට කැමති කවු ද?
- පේරවලට කී දෙනෙක් කැමති ද?
- ඔබ වඩාත් කැමති පලතුර කුමක් ද?
- ජම්බුවලට කී දෙනෙක් කැමති ද?

03.ළමයි කැමති මල් වර්ග පහත දැක් වේ.







| | | |
|---|---|---|
| මිනුලි | රිෂානා | තරුෂ |
| චාරුක | අරෝෂ | මාධවන් |
| අමිරු | | කුමාරි |

❖ රූප බලා ළමයි කැමති මල්වලට යා කරන්න.

මිනුලි



අමිරු

කුමාරි

අරෝෂ



තරුෂ

මාධවන්

චාරුක



රිෂානා

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

ගණිතය - 2 ශ්‍රේණිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

නම - පී.වී.චන්ද්‍රිකා සමන්ලතා

ර/වේවැල්වත්ත කනිෂ්ඨ විද්‍යාලය

## 03 පාඩම - සම්බන්ධතා හඳුනා ගැනීම

<u>පසු වැඩ කාර්ය පත්‍රිකාව</u>

01. පෝච්චි 5 ක් ගෙන පස් පුරවා ඒවායේ එළවළු පැළ 5ක් සිටුවන්න.
02. ගෙදර සෑම කෙනෙකුට ම වතුර බොන කෝප්පයක් බැගින් තිබේ දැයි බලන්න.
03. පවුලේ සාමාජිකයන් ගණනට ජංගම දුරකථන තිබේ දැයි බලන්න.
    - දුරකථන ඇති අය කීය ද?
    - දුරකථන නැති අය කීය ද?

04. ගෙදර අයගෙන් කැමති ම පාට කුමක් දැයි අසන්න.

    - වැඩි දෙනෙක් කැමති පාට කුමක් ද?
    - රෝස පාටට කැමති අය කී දෙනෙක් සිටී ද?
    - සුදු පාටට කැමති ගණන කීය ද?

05. එකට එකට යා කරන්න.

වැඩියෙන් ඇති ගොඩ නිල් පාටින් ද අඩුවෙන් ඇති ගොඩ රතු පාටින් ද පාට කරන්න.



06. සමනලුන්ට යා කිරීමට ගැළපෙන දෙයක් ඇඳ එකිනෙකට යා කරන්න.

